දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail } sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/8/1/44/1/9/2013

ඔබේ අංකය / உமது இல. / Your No. } 2/1/17/2/13

දිනය / திகதி / Date } 2013.12.17.

20 DEC 2013

ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

<u>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය.</u>

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2013.11.29 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත උසස් කිරීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ උසස් කිරීමේ පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

එම්.ඩී.ජේ.ප්‍රසාද්
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් :

01. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් (මුල් පිටපත මේ සමග එවමි)
03. අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමග එවමි)

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ**

**ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය**

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යොමු අංකය : DTET/04/AO/SOR/PL දිනය : 2013.07.24

1.2 අමාත්‍යාංශය : යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යොමු අංකය : 2/1/17/2/13 දිනය : 2013.08.12

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම යොමු අංකය : DMS/C/5/461 Vol I දිනය : 2013.06.04

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය : EST-2/RECRU/03/2056 දිනය : 2013.06.26

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය යොමු අංකය : NSCC/1/44/1/SR දිනය : 2013.04.26

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යොමු අංකය : PSC/EST/8/1/44/1/9/2013 දිනය : 2013.11.~~20~~ 19

**02. පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : ප්‍රාථමික – අර්ධ ශිල්පීය

3.2 ශ්‍රේණි : III, II, I. විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයෙහි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍යවන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන ඉදිකිරීම්, නඩත්තු, අළුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා / කාර්මික නිපුණතාවයන් අවශ්‍ය වන්නාවූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධාරියා විසින් ඒ ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :** ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : PL – 2 – 2006 (ඒ)

5.2 වැටුප් පරිමාණය : රු. 12,210 – 10X130–10X145-10X160–12X170–18,600

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 1 | රු 12,210/- |
| II ශ්‍රේණිය | පියවර 12 | රු 13,655/- |
| I ශ්‍රේණිය | පියවර 22 | රු 15,120/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු 16,730/- |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අරක්කැමි | III/II/I හා විශේෂ | 02 | 1. අවශ්‍යතාවය පරිදි ආහාර පිළියෙළ කිරීමේ කටයුතු<br>2. තනතුරට අදාළව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී කටයුතු |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

අරක්කැමි - 02

07. බඳවා ගැනීමේ ක්‍රමය : දැනට සිටින නිලධරයන්ට පෞද්ගලික වන සේ සැකසූ උසස්වීම් පරිපාටියක් බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| ක්‍රමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත / වෘත්තීය / සහතික පාඨමාලා / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය ( ඇමුණුම 01 ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස්වී වසර 03 ක් ගතවීමට පෙර | නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය ( ඇමුණුම 02 ) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය ( ඇමුණුම 03 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1 කාර්යක්ෂමතා කඩඉම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

2 කාර්යක්ෂමතා කඩඉම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

3 කාර්යක්ෂමතා කඩඉම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

**09. භාෂා ප්‍රවීණතාව :**

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම**

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :-

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ 111 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය ( 10 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 11 ශ්‍රේණියට උසස් කිරීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලැබේ.

**10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය ( 09 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය ( 09 ) ම උපයාගෙන තිබීම.

II. පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය ( 09 ) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

**10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නමය ( 09 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නමය ( 09 ) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුරව වූ වසර නවය ( 09 ) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූති නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සේවයේ යෙදී සිටින නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය :

මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරියාට පමණක් අදාළ වේ.

මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006 හා ඊට අනුෂංගික චක්‍රලේඛ මගින් ලබාදී ඇති PL – 2 - 2006 ( ඒ ) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරියා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධානවලට අනුව III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

TRANSMISSION VERIFICATION REPORT

TIME : 14/12/2013 10:51
FAX : 0112459077
SER.# : G01234567890

DATE,TIME 14/12 10:50
DURATION 00:00:36
PAGE(S) 01
RESULT OK
MODE STANDARD ECM

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරුවට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තන් අවසන්වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

| | |
|---|---|
| සකස් කළේ : අත්සන : (signature) | පරීක්ෂා කළේ : අත්සන : (signature) |
| ( විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධරයා ) | ( විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා ) |
| නම : ඒ. ජේ. සරත්චන්ද්‍ර. | නම : බී. පී. සී. කුලරත්න |
| තනතුර : පරිපාලන නිලධාරී, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ඔල්කට් මාවත, කොළඹ - 10. | තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඔල්කට් මාවත, කොළඹ - 10. |
| දිනය : 2013/11/22 | දිනය : 2013/11/22 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : (signature)

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, නිල මුද්‍රාව: තැ.පෙ. 557, ඔල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2013/11/26

යොමු අංකය : 2/1/17/2/13

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : (signature)

නම :

( ලේකම් )

ඩබ්ලිව්.ඒ. ජයවික්‍රම
අතිරේක ලේකම් (පරිපාලන හා මූල්‍ය) ................ අමාත්‍යාංශය
යෞවන කටයුතු හා
නිල මුද්‍රාව: නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
"නිපුණතා පියස",
354/2, ඇල්විටිගල මාවත, කොළඹ - 05.

දිනය : 2013 - 11 - 28

යොමු අංකය : PSC/ESS/8/1/44/1/9/2013

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා වන මෙම උසස් කිරීමේ පටිපාටිය 2013.11.19 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : [signature]

නම :

( ලේකම් )

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2013.12.13

නිල මුද්‍රාව :

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට.
කොළඹ-05.

1. විභාගයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 % |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ I සිට VIII දක්වාද XII, XIII, XIV, XXIV, XXVII, XXXI, XXXII වැනි පරිච්ඡේද |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි I, V, XII, XIII පරිච්ඡේද |

සකස් කළේ :

අත්සන : ..............................

නම : ඩී. ජේ. සරත්චන්ද්‍ර.

තනතුර : ..............................

දිනය : 2013/11/22

පරීක්ෂා කළේ :

අත්සන : ..............................

නම : බී. පී. සී. කුඹුරත්න

අධ්‍යක්ෂ (පරිපාලන)

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

තනතුර : ..., කොළඹ - 10.

දිනය : 2013/11/22

අත්සන : ..............................

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,

දිනය : තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10.

නිල මුද්‍රාව: 2013/11/26

ඇමුණුම 02

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| පරීක්ෂණය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 100 | 40 % |

3, පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| පරීක්ෂණයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1. වට්ටෝරු අනුව ආහාර පිළියෙල කිරීම<br>2. ආහාර පිළිගැන්වීම<br>3. පිරිසිදු බව හා ක්‍රමවත් බව ආරක්ෂා කර ගැනීම<br>4. යම් නිශ්චිත පුද්ගල සංඛ්‍යාවක් සඳහා ආහාර වේලාවක් සැකසීමට අවශ්‍ය භාණ්ඩ ලැයිස්තුවක් සකස් කිරීම |

සකස් කළේ :

අත්සන :

නම : පී. හෝ. සරත්චන්ද්‍ර.

තනතුර : පරිපාලන නිලධාරී, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ - 10.

දිනය : 2013/11/22

පරීක්ෂා කළේ :

අත්සන :

නම : බී. පී. සී. කුලරත්න

තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කොට් [illegible]

දිනය : 2013/11/22

අත්සන :

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,

දිනය : තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10.

නිල මුද්‍රාව: 2013/11/26

ඇමුණුම 03

1. විභාගයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ දැනුම හා අවබෝධය අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී දක්වන ප්‍රවීණතාවය මැන බැලීම |

සකස් කළේ :

අත්සන : ..........

නම : ඩී. කේ. සමරචන්ද්‍ර. [illegible]

තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කොට් මාවත, කොළඹ - 10.

දිනය : 2013/11/22

පරීක්ෂා කළේ :

අත්සන : ..........

නම : බී. පී. ඩී. [illegible]

තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ 10.

දිනය : 2013/11/22

අත්සන : ..........

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,

දිනය : තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10.

නිල මුද්‍රාව: 2013/11/26